# සිසිරයේ පිපුන මල

ජගත් ජේ එදිරිසිංහ

**කර්තෘගේ වෙනත් කෘති**

කන්ද උඩ මාළිගාව (කෙටි කතා) 1999

# සිසිරයේ පිපුන මල

ජගත් ජේ එදිරිසිංහ

**ප්‍රථම මුද්‍රණය**
2000

**(c) ජගත් ජේ එදිරිසිංහ**
ISBN

**ප්‍රකාශණය**
ඩබ්ලිව් ජේ එදිරිසිංහ

**මුද්‍රණය සහ බෙදාහැරීම**
සාර ප්‍රකාශණ සහ මුද්‍රණ
කොට්ටාව

**පසුපිට ඡායාරූපය**
සනත් ද සිල්වා

**කවර නිර්මාණය සහ ඇතුලත සිතුවම්**
ජගත් ජේ එදිරිසිංහ

අයියා යමක් ලියමින් සිටියි. ඔහු ලියන්නේ කවියක් බව පිටුපසට වී බලා සිටින මට පෙනෙයි.

***අසිරිමත් සිරිලක !?***

*හන්දියේ මැද තිබෙන - සම්බාර් හෝටලෙන්*
*විසිකරන ඉඳුල් කොල - පොදි කරන අදහසින්*
*කුසට ආහාරයක් - ලබමි යන අදහසින්*
*කුණු බාල්දිය හෙවත් - බදුරුගට වෙතට ගිය*
*පොඩි එකා අද ආවෙ - කනේ පාරක් කාල*
*මැනේජර උතුමගෙන්*
*සම්බාරු හෝටලේ - රේඩියෝ එකෙන් එන*
*කර්ණාටික ගීතයේ - ගෝසාව මැද්දෙන්*
*එයි හඬක් කොහෙන්දෝ*
*සිතාරෙද ගිටාරෙද - නැතොත් මොන උලව්වද?*
*එයට කියනා නාමෙ - නොම දනියි පොඩි එකා*
*මී විතක් අතින් ගත් - කඳ බඩ ඇතියවුන්*
*වෙසෙන මහ මැදුරේ - පිය සාදයකි අද*
*මස් කඩෙන් විසි කරපු - මස් ලේ වලින් තොර*
*කටුවකට ඉව වැටුන - බලු නාට්ටෙක් වගේ*
*(හොඳ බල්ලන් සිටින්නේ - මහ මැදුරු වල පමණි)*
*ඇදුනි කොළුවා ඒ දෙසට*
*ප්‍රවේසම් වෙනු බල්ලන්ගෙන් - (උන් සිටින්නේ මැදුරෙදෝ)*
*ළඟට එන විට කොළුවා - වැසුනි පියන් පත් මැදුරේ*
*අහෝ දම් දිවද මෙය....?*

අයියා සිටියේ උසස් පෙළ පන්තියේය. මා දහවන ශ්‍රේණියේය. කවියේ නව මං සොයන්නට මගේ ඇස් පෑදුවේ අයියා ජීවිතයේ ලියූ ඒ  එකම එක කවියයි. මේ තාක් කාලයක් මේ කව සුරැකිව තබාගෙන සිටියේද එනිසාමයි. නිර්මාණකරනයටත් උසස් අධ්‍යාපනයටත් අඩිතාලම දැම්මේ ඔබ බැවින් මගේ මුල්ම කාව්‍ය සංග්‍රහය ඔබටම පුදන්නට මගේ සිත මට බල කරයි.

මේ පොත මගේ අයියා
වරලත් යාන්ත්‍රික ඉංජිනේරු **පුෂ්ප කුමාර ජේ. එදිරිසිංහ** ට
සොයුරු පෙමින් පුද කරමි.

# සංවාදය

නිවී සැනසිල්ලේ හිඳ කවියක රස විඳින්නට හැකියාව ලබාදෙන සන්සුන් මානසිකත්වය අප සමාජයෙන් බැහැරව යමින් තිබේ යයි මට සිතෙයි. මේ පිළිබඳව බොහෝ දේශපාලනමය විග්‍රහයන් ඇති නමුත් මේ පරිසරය විසින් බිහිකරනු ලබන්නේ කවියක සුන්දරත්වය වින්දනය නොකරන අවාසනාවන්ත යාන්ත්‍රික මානව මානවිකාවන්ය යන්න අවිවාදිතය.

“මම කවි පිටුව කියවන්නෙ පත්තරේ වෙන කියවන්න කිසිම දෙයක් නැතිවුනහමයි...” මගේ ලිපියක් පුවත්පතක දුටු වහාම මට නොවරදවා දුරකථන ඇමතුමක් දී සතුට පළකරන සොයුරු බින්දු වරක් මට කීවේය. මම ඔහු පිළිබඳව සතුටුවෙමි. කොහෙත්තම කවි පිටුව නොකියවන අති බහුතරයක් අතර ඔහු අගැයිය යුතුය.

ඉදින් සංසාර පුරුද්දට මෙන් කවි ලියන, කවියට පෙම් කරන, අප මේ කරන්නේ උඩු ගං බලා පිහිනීමක් නොවන්නේද? සැබැවකි... මම මෙසේ කියමි. පිහිනනවා නම් පිහිනිය යුත්තේ උඩු ගං බලාමය.

මේ මොහොතේ මට සිහිපත් වන හිතවතුන් බොහෝය බොහෝ අවිවේකයෙන් සිටියද මෙහි පෙරවදන ලියා දුන් රත්න ශ්‍රී විජේසිංහ, මා ලියූ කවි පිළිබඳ අදහස් දක්වා නිබඳ මා උනන්දු කරන හෙන්රි ජයසේන, මගේ කන්ද උඩ මාළිගාව කෙටිකතා සංග්‍රහය පිළිබඳ අදහස් දැක්වා එවූ ජයතිලක කම්මැල්ලවීර යන මහත්වරුනට මම ස්තුතිවන්තවෙමි. මට බොහෝ උපකාර කල රාවයේ සොයුරු තිඹිරියාගම බණ්ඩාර ද මට අමතක නොවේ.

මා හිතවත් රෝලන්ඩ් අබේපාල මහතා නොවන්නට මේ පොතද සිහිනයක් වන්නටම ඉඩ තිබුනි. ඔහුටද සාර ප්‍රකාශණ ආයතනයේ කාර්ය මණ්ඩලයටද බොහෝ ස්තුතියි.

මගේ නිර්මාණ පලකිරීමෙන් නිබඳ මා දිරිමත් කල රාවය, ලක්බිම, දිවයින ඉරිදා සංග්‍රහය ඇතුළු පුවත්පත් සියල්ලේ කවි

පිටු සංස්කාරකවරුනටද ස්තුතිවන්තවෙමි.

පසුපිටේ ඡායාරූපය ගත් සනත් ද සිල්වා, නිතර මට ලියමින් මා දිරිමත් කරන අජිත් මාතොටආරච්චි සහ ඒ. කේ. එම්. ටිකිරිබණ්ඩා, පාසල් වියේ සිටම අත්බැඳගත් තිලක්, පාලිත, අනුර සහ උදය සොහොයුරන් ආදරයෙන් සිහිපත් කරමි. මේ කාව්‍ය සංග්‍රහය සකසමින් සිටියදී බොහෝ කරදර කළ මගේ අබලන් පරිගණකයට නව පණක් ලබා දුන් සොයුරු මනික් ද මේ උත්සාහයේ හවුල්කරුවෙකි.

මෙල්බර්න් 3ZZZ ගුවන්විදුලියේ සිංහල සේවාවේ රෝහණ කරුණාරත්න, ආනන්ද බාලසූරිය සහ ගාමිණී ෆොන්සේකා සොහොයුරන් මට ලබාදුන් සහය මිළ කරනු නොහැකිය.

මගේ කෙළවරක් නැති කරදර විඳ ගනිමින් මා පිටුපස සිටින තාත්තාටත් අම්මාටත් මගේ ගෞරවාදරය හිමිවෙයි.

මට නිබඳ සහයෝගය දෙන පාලිත් මගේ මිහිරි කරදරකාරියන් දෙදෙනා, තාරුත් ඉෂිනිත් මේ නිර්මාණ වල පංගුකාරියන්ය. අක්කාත් අයියාත් මල්ලීත් නංගීත් මට ශක්තියකි.

මගේ නිර්මාණ කියවා අදහස් දක්වා එවූ මට හමු වූ සහ හමු වී නැති හිතවතුනට සහ හිතවතියනට මගේ ස්තුතිය පුදකරමි

මේ ගමන කෙතරම් දුෂ්කර වුවද මා බොහෝ දුර යා යුතුව තිබේ. මගේ මග තනාගනු පිණිස මේ පොත පිළිබඳ ඔබේ අදහස් මට දන්වා එවන්න.

**ජගත් ජේ. එදිරිසිංහ**

4/1 වැලිකල මාවත
පාගොඩ පාර
නුගේගොඩ

ඔක්තෝබර් 2000

# සරුසාර කවිකමක පෙරමග

මවුබිමෙන් බැහැරව දිවිගෙවන කවියෙකුගේ අධ්‍යාත්මික ජිවිතය, ලෝක ප්‍රජාවගේ අත්දැකීම් නිරීක්ෂණයෙන්ද, නවීකෘත දෘෂ්ඨිවාද හා විචාර සංකල්ප ඇසුරෙන්ද අතිශය සංකීර්ණ වී ඇතැයි අපි සිතමු. එනයින්ම ඔහුගේ කවිය ලෝක ප්‍රජාව අමතන සුවිශේෂ වූවකැයිද සිතමු. එහෙත් ඒ සිතිවිල්ලේ ඇත්තේ අර්ධ සත්‍යයක් පමණී. සැබැවින්ම කවියෙකුගේ අධ්‍යාත්ම ජිවිතයෙහි මුල් ඇත්තේ මව් පසෙහිමය. මව් බසින් සිතන ඔහුගේ සියලු සිතිවිලි සරසන්නේ මව් බිමේ භෞතික හා අධ්‍යාත්මික පරිසරයයි.

ටී. එස්. එලියට් නම් අපරදිග කවියා වරෙක සංකල්ප රූප අරභයා කියූ කියමනක් ඉහත සිදුවීම සනාථ කරයි.

*"කවියකු හෝ වෙනත් කතුවරයකු නිමවන සංකල්ප රූප වලින් කොටසක් ඔහු ලබාගන්නේ තමා කියවූ දෑ ඇසුරිනි සෙසු සියල්ල ඔහු ලබාගන්නේ කුඩා අවධියේ පටන්ම ගෙවූ සිය ජිවිත අත්දැකීම් ඇසුරිනි"*
*(T. S. Eliot - Use of Poetry and Use of Critisism - Conclusion 1933)*

සංකල්ප රූප පිළිබඳ ඉහත කරුණු කතාබහ කරමින්, ජගත් ජේ. එදිරිසිංහගේ කවි පිළිබඳව සාකච්ඡා කිරීම ඇරඹීම සුදුසු බැව් හැඟුනේ, එකී අදහස් ඔහුගේ

කවියට වඩාත් අදාල වන බැවිනි. වසර කීපයක් තිස්සේ ජගත් මව්බිමෙන් ඈත් වී ඔස්ට්‍රේලියාවේ රැකියාවක යෙදී සිටියි. ඉකුත් වූ වසර හත අට තිස්සේ ඔහු ලියූ කවි මෙරට බොහෝ සිංහල පුවත් පත් වල පළවිය. ඒ කවි

සියල්ලම, නැතහොත් ඉන් වැඩි ප්‍රමාණයක්, සැරසී තිබුනේ ටී. එස්. එලියට් ගේ සංකල්ප රූප පිළිබඳ කියමන සනාථ කරන මව්බිමේ සම්පත් වලිනි.

ජගත් ජේ. එදිරිසිංහ ගේ කවියෙහි තවත් විශේෂතාවක් වන්නේ බොහෝ විට ඒවා වෘත්තයක පිහිටා ලියැවී තිබීමයි. ඒ විරිත් ඇතැම් විට සාම්ප්‍රදායික වන අතර ඇතැම් විට අලුතින් තනාගත් ඒවාය. එහෙත් අත්දැකීමට සරිලන සේ විටෙක ඔහු නිදහස් කාව්‍ය රීතියේ පිටිවහලද ලබාගනී.

පෙරදිග ආසියානු සමාජයේ, විශේෂයෙන් ශ්‍රී ලාංකික කුටුම්බයේ, මව් පිය දරු සබඳතා තරම් සම්පවූත් හෘදයංගමවූත් අත්දැකීමක් නැත. පියෙකුගේ හෝ මවකගේ ලෝකය ඔහුටම අනන්‍ය වන අධ්‍යාත්මික බන්ධනයෙන් නිර්මිතය.

මා දෙඅත හිස තබා උරතලේ උණුසුමේ
සැගව නිදනා නුඹේ කිරි සිනා මට ඇසේ
හිරි වැටී රිදුම් දෙන නමුදු අත් දෙක මගේ
නොසෙල් වී සිටිමි නුඹ නින්ද නොබි දෙන ලෙසේ

සද්ධර්ම රත්නාවලියේ, පටාචාරා වහන්දෑගේ වස්තුවේ එන පරිදි, පටාචාරාව ඇගේ තුන්වන දරු ප්‍රසූතියේ දී අකාල මේඝයෙන් දරුවන් ගලවා ගන්නී දරුවන් දෙදෙනා බඩතුරෙහි ලා ගෙන දෙදනින් වැලමිටින් බිම හොවාලා තුන්යම් රෑ මුළුල්ලේ නොසෙල් වී තෙමෙමින් සිටියාය. ජනප්‍රිය සිංහළ ගීතයකද "පායන තුරු හිටි පියවර හිටියා නුඹ අම්මේ" යි කියැවේ. දරුවාගේ නින්ද බිඳෙතැයි



නොසෙල් වී ඉන්නා මේ පියාද එබඳුම දරු සෙනෙහසක් ඇත්තෙක් නොවේද? එකී දරු සෙනෙහසට සියළු දුක් තැවුල් ද පීඩාවන්ද නිවාලිය හැකි බැව් ජගත් තව දුරටත් මෙසේ කියා සිටියි.

ගිම්හාන තාපයට දැවුන තණ පත් අරන්
ගිනී සුළග පෙර දිනේ කෙළි කවට පෑ තරම්
නුඹ ඇවිත් සිටින සඳ හිම සිසිල පොදි බැඳන්
කොතැන වෙද සැනසුමක් මේ වහල යට තරම්

එම සෙනෙහස ආත්මාර්ථය පිනිසම නොවන්නේය. ඊට සෙසු ලෝකය වෙනුවෙන් ද ඉටුකරන්නට සුදුසු භූමිකාවක් ඇත්තේය. "ලෝකයටම ආදරය කරන ස්වාමියා" නම් රචනය එබඳු විශාල ප්‍රජාවක් වෙත ආදරය ගෙන යා යුතු බැව් සිතන සැමියෙකුගේ සිතිවිල්ලකි.

වැවක් සේ සිර නොකර නුඹේ සිත් බැමි අතර
ගලන්නට දස අතට ඉඩ දෙන්න මා සිතට
පහන් සිළ වනු කෙලෙස නුඹ කුටිය තුල දැවෙන
පහන් තරුවක් විලස දිලෙන්නට සිතෙන සඳ

ස්වාර්ථය සාධනය මතු නොව, පරාර්ථ සාධනයද සැබෑ ආදරයක පරමාර්ථය බැව් ජගත් එම රචනයේ අවසන වඩාත් ව්‍යක්ත අයුරින් කියා සිටී.

සමාවිය යුතුය මට මා කියන සැබෑවට
විමානය නුඹ තැනුව කුඩා වැඩි වේය මට
මුදාලනු මැනවි බැමි, කමා නැත පමාවට
ප්‍රමාදය මා දැනුත් හමන්නට සොයා ලොව

ගේහසිත ජීවිතයේ අත්දැකීම් වැඩිපුරම සිය කවියට වස්තු කොට ගන්නා ජගත් එහිදී සෙසු රචනා වලට වඩා සමත්කම්ද පෙන්වන බැව් පෙනේ. මව්බිමෙන් දුරබැහැර ඉන්නා ඔහුට මිනිස්කම්වල ගුණ තදින් දැනෙනවා විය

යුතුය. "පියවරුන්ගේ දිනය දා" නමින් යුත් කවිපෙල ද එවැන්නකි. ඔහු එහිදී විරිතට ගෙන ඇත්තේ පැරණි ගී ආකෘතිය අනුව ගිය කෙටි විරිතකි. එය පියවරුන්ගේ ඖදාර්යය පළකිරීම සඳහා උචිතය.

මහ මෙර සේ නොසැලී
දිනකර සේ බැබලී
දිවිබර ගෙන උරෙනී
පියවරු ලොව තනතී

මැසිවිලි නැති මුවිනී
දුක් දොම්නස් විඳිතී
උතුරන සෙනෙහසිනී
දරු බර විඳ ගනිතී

ගෘහස්ත ජීවිතයේ මානව සම්බන්ධතා ඇසුරින් විවේචක රීතියක පිහිටා කරනු ලබන සමාජ විවරණයක් දක්වා ජගත් ගේ කවි සිත යොමු වූ අවස්ථාවකි "අම්මගෙ ලියුම". ගමේ සියළු අගහිඟකම් විඳ දරා ගෙන ඉන්නා මේ අම්මා කලකින් ගෙදර නොපැමිණි මද්දුම පුතා වෙත යවන ලියුම හුදු පුද්ගලානුභූතින්ගෙන් පමණක් සැරසුනක් නොවේ. වඩාත් අවධානශීලීව අවට බලන මේ මව සමාජ දේශපාලනය කෙරෙහිද සංවේදී වන්නියකි.

පන්සලේ අළුත හැදූ තාප්පය පුරාවට
යුද්දයම ඉල්ලලා පෝස්ටර ගසා ඇත
තුන් යමේ මං වගේ අම්මලා අඬන විට
පෝස්ටර වසාගෙන ඒ කඳුළු ගලනු ඇත

යුදවාදී ස්ත්‍රීත්වය ඉක්මවා අත්දැකීම්වලින් පරිනත වී ඇති මේ මව තමාගේ පටු ලෝකය ඉක්මවා දකින්නට තැත් කරන්නීය.



රජෙක් වගෙ ලොකු පුතා හොරු අරන් ගිය දිනේ
මගේ රජ මාළිගේ දූවිලි ව වැනසුනේ
ඒ වගේ තවත් රජ වරු ඇතිය යාපනේ
උන් හොරෙන් අරගන්න උදවි නොම දෙනු පුතේ

ප්‍රේමය පිළිබඳ අත්දැකීම් වුවද ජගත් කවියට නගන්නේ සෙසු බොහෝ තරුණ කවීන් මෙන් සුසුම් පද මිශ්‍ර ඒකාකාරී වදනින් නොවේ. ඒවායේද අපූර්වත්වයක් පළවෙන පරිදිය.

තාරුකාවට මූණ නොම පෙන්නා
මාස පෝයට සඳු සැඟවුළන්නා
හීන යායේ කැකුළු දුක්වෙන්නා
බෝම දුකකින් මං බලා උන්නා

ප්‍රේමයේ මාධූර්යය පමණක් නොව ඊට සරසක්ව නැගී සිටිනා විවිධ සමාජ ආර්ථික කාරණාද ඔහුගේ කවියට හසුවේ.

ගමෙන් උදුරන් ඇවිත් සිදාදියෙ හිටෙව්වට
මේ පොළව සරු නැතිය අපේ ජිවිත වලට
ආදරයෙ සිසිල් දිය පොදක් විසි කර සිතට
ජිවිතය ගොඩගන්න හිතෙන්නේ මොන පවට

ප්‍රේමයේ විප්‍රලම්භය පළකරන විටදී පවා ජගත් භාවාතිශය ලෙස වදන් නොහසුරුවන්නට පරෙස්සම් වෙයි. "මරණ මංචකය" නම් කවි පෙළ ඊට නිදසුනකි.

විහඟ ගී රාවයක
මිහිර දෙසවන ගැටේ
පුළුන් රැල්ලක් ලෙසින
සැහැල්ලුය සිත මගේ
මගේ කෙහෙ අතර රැඳී
මුදු ඇඟිලි තුඩු නුඹේ

උහුලගත නොහැකිවන
මහ බරක් ලෙස දැනේ

සමාජ ආර්ථික පරිසරය විවරණය කෙරෙන අත්දැකීම් කවියට නගද්දී ජගත් ජේ. එදිරිසිංහ දැඩි විරෝධාකල්ප ස්වරයක් වෙනුවට සියුම් උත්ප්‍රාසයක් මතුකරන්නට දරන උත්සාහය කැපීපෙනේ. "පිළිම නෙලීම" යනුවෙන් නම් කොට ඇති රචනය කදිම උදාහරණයකි.

ඇස් පිනා දනන් නගරේ
සෙල් පිළිම ලෙසින් දිසියේ
තට්ටු කර බැලූ දවසේ
බොල් හඬක් නැගේ

මිතුරු වඩුවරුන් නැත්තෙන්
කටු මිටිත් අරන් දෑතින්
නෙලන්නට මගෙම පිළිරුව
මටම දැන් සිතේ

ගැටළු සහ අභියෝග වලින් ආකුල වී ඇති තාරුණ්‍යයේ ලෝකයද ජගත් ගේ කවියට මගහැරී නැත. තරුණ ජවයත්, අවංක අධ්‍යශයත්, කෙරෙහි ආශක්ත නොවී, එහෙත් මානුෂිකව එම ලොව නිරීක්ෂණය කරන්නට ඔහු උත්සාහ දරනු පෙනේ. කටවහරේ පිව ගුණය සාර්ථක අයුරින් මේ ප්‍රශ්ණ කිරීම් සඳහා ඔහු යොදාගනී.

ඇස් ඉස් මස්ද දන් දී
බුදු බවද පතන්නේ
මේ ලොව දරන්නේ
මිසදුටුන් බව නොදනීද..?
දෙවියන් වහන්සේගේ පුත්‍රයාත්
ඇණ ගැසූ පව්ටු ලෝකයය මේ
තවත් දහසක් පුත්‍රයන්
ඇණ ගසන එක කප්පක්ද..?



ජගත් ජේ. එදිරිසිංහ සියුම් නිරීක්ෂණ ශක්තියක්ද තියුණු සංජානන ශක්තියක්ද ඇති ප්‍රතිභාවන්තයෙකි. ව්‍යුත්පත්පත්තිය හා අභ්‍යාසය විසින් ඔහුගේ කවීත්වය ඉදිරියේදී වඩාත් සරුසාර කරනු ඇත. ඒ කවි ශක්තිය නූතන සිංහල කවියට අලුත් සවියකි.

**රත්න ශ්‍රී විජේසිංහ**
2000.07.28

# ඇතුලත


| | |
|---|---|
| මගේ ලෝකය | 15 |
| අප්පච්චි | 17 |
| නුගත් ඝාතකයාගේ කවිය | 18 |
| දික්කසාද වූ තාත්තාගේ රාත්‍රිය | 19 |
| ලෝකයටම ආදරය කරන ස්වාමියා | 20 |
| තාර පාර | 22 |
| හෙට පිපෙන මල | 23 |
| කරණාය | 24 |
| පියවරුන්ගේ දිනය දා | 25 |
| සඟවාගත් ආදරය | 26 |
| ඝාතනයෙන් කලකට පසු | 27 |
| සඳ එළිය සහ ඔබේ ප්‍රේමය | 29 |
| ආත්මාරිථයෙන් තොර ප්‍රේමය | 30 |
| අම්මගේ ලියුම | 31 |
| ඔබ | 33 |
| පෙම් කවිය | 34 |
| මායාව | 35 |
| සිසිරයේ පිපුන මල | 36 |
| අයිතිය | 37 |
| නිදහස | 38 |
| මාළිගාව | 39 |
| පිටුවහල් දේශය | 41 |
| පිළිම නෙළීම | 42 |
| කවිය | 43 |
| දිග කතාවක් | 43 |
| හතර රියන යට | 44 |
| හිමේ නඩුව | 45 |
| අතුරුදන් වූ මිත්‍රයා | 46 |
| පූජේම් බුද්ධං | 51 |
| පතොක් මල | 51 |
| උමා | 52 |
| පහන් තරුව | 53 |
| මරණ මංචකය | 54 |
| වසන්තයේ නිමාව | 56 |




# මගේ ලෝකය

ජීවිතය හිරිවැටෙන සීතලක ගැලෙන සඳ
සැනසිල්ල දරුවනේ නුඹේ උණුසුමය මට
මල් සිහින දකින නුඹ විසිරුවන සිනා පොද
දකින මා අතැර දා පලා යයි නින්ද අද

මා දෙඅත හිස් තබා උරතලේ උණුසුමේ
සැගව නිදනා නුඹේ කිරි සිනා මට ඇසේ
හිරි වැටී රිදුම් දෙන නමුදු අත් දෙක මගේ
නොසෙල් වී සිටිම් නුඹ නින්ද නොබිඳෙන ලෙසේ

තාරුකාවක සැඟව ගී ගයන සීනයේ
මා නොමැති වුව කමක් නෑ මගේ දරුවනේ
වාසනාවට පිපුන මල් පැටව් දෙස මගේ
මම බලා සිටිම් නැත මෙවන් සැපතක් ලොවේ

ගිම්හාන තාපයට දැවුන තණ පත් අරන්
ගිනි සුළඟ පෙර දිනේ කෙළි කවට පෑ තරම්
නුඹ ඇවිත් සිටින සඳ හිම සිසිල පොදි බැඳන්
කොතැන වෙද සැනසුමක් මේ වහල යට තරම්

තණ පළස සිප ගන්න පිනි පොදට දී වරම්
වැළපෙන්න ඉඩ දෙන්න සඳ වතට ඇති තරම්
ගුණ සුවඳ විහිදන්න පිපී අරුණලු අරන්
නිදියන්න නිදියන්න සුව සිහින ගුලි කරන්





# අප්පච්චි

තාරුණ්‍යය පරව විසිරුණු පෙති මත්තේ
පියවර තබා හැර ගිය දින සරසවිය
කඳුලක් වෙලා වැගිරුණි ගුගුරා අහස
අප්පච්චියේ නුඹ හෙළු දහඩිය කන්ද

ගෙවෙන විටදි දහසක් පය මහ මගට
සුළඟක් ලෙසින් දැවටුනි නුඹගේ සුසුම
නිවනා දිනය ගිනි කඳ නුඹ හද දවන
දහසක් කල්පයක් ඇතින් පෙනෙයි මට

ගෙය තැනුවේ නුඹය සෙවනට මගෙ හිසට
දිය ඇද්දේ නුඹය පවසට මගෙ කුසට
පව ගෙව්වේ නුඹය පෙර කළ මගෙ පිනට
ණය වපුලේ නුඹය සිප් අස්වනු මටය

නිවනක් නොදැක දහඩිය නුඹේ වැගිරුන
සටහන් කොල මතෙහි අකුරකට පෙරැලින
මගෙ බර පවුලෙ බර දෙඋරයෙන් දරමින
නුඹ යෝධයෙකි නුඹ ළඟ කුහුඹුවෙකි මම

අහස විසකුරුය මහ පොළව තුරිරුය
තනන මාළිගා අප දෙදෙන දුබලය
දිනෙක නුඹ සිහින ලොව රජවීම තිරමය
අහස පොළව යළි ගොඩ නැගිය යුතුමය

# නූගත් ඝාතකයාගේ කවිය

නීතිඥයන් දෙදෙනෙකු මැරුවෙමි රයේ
දොස්තර කෙනෙකු අළු කෙරුවෙමි දර සෑයේ
සගය බලව අර මුල්ලේ ගැහෙන්නේ
ඉංපිනේරුවෙකි අත් පා කපා දැමූ

කඩුවෙන් කළ යුත්ත පෑනෙන් වලකන්න
වැර දැරූ උන්ට කර ඇති දේ බලපන්න
මුර දේවතාවන් කුමටද මේ දැයට
බණ පොත් ගිණි තබමි උණුසුම ලැබ ගන්න

උපාධිය සමග කඩුවක් නොදෙන නිසා
බොහෝ පහසු විය කරනට මගෙ සේවේ
මගේ අසිපතට නැත කිසි අභියෝගේ
උගත් කම මොටද කඩුවක් නොමැතිකොට

නිමා කොට රැයක් බොහො වෙහෙසයි සගය
විවේකයට සැතපෙමි කහවනු මත්තේ
හෙටත් නැවත ඕනෑවෙන නිසාවට
මුවත් තබමි අසිපත ඇහැරුණ පසුව





# දික්කසාද වූ තාත්තාගේ රාත්‍රිය

රාත්‍රිය බොහෝ සීතලයි
උණුසුමට තුරුළු කරගන්නට
දරු පැටවකු නැති සඳ

තණ පතක අග රැඳුන
පිණි බිඳක් මත වැටුන
සඳ රැස් කැරැල්ලක
අසිරිය පෙන්වා දෙන්නට
දරුවන් නොමැත මා ළඟ.....

නිශාචර මද සුළඟ
කවුළු දොර එපිට සිට
මුමුනනා ගීතයේ
සැඟවගත් අපූරුව
කියා පෙන්වා දෙන්න
නුඹ මවෙත සිටී නම්......

රාත්‍රිය නිසසලයි
විඳගත නොහැකි පාළුවයි
නුඹ වපුල බොළඳ බස්
ඇතකින් මට ඇසෙයි......

# ලෝකයටම ආදරය කරන ස්වාමියා

මලක් සේ පිබිදෙන්න ඉඩ දෙන්න සොඳුර මට
බෙදන්නට හද රැඳුන මුදු සුවඳ මුළු ලොවට
ගඟක් සේ ගලන්නට ඉඩ දෙන්න සොඳුර මට
තෙමන්නට සිසිලසින්, ඉරිතැළුන බොල් පොළොව


වැවක් සේ සිර නොකර නුඹේ සිත් බැම් අතර
ගලන්නට දස අතට ඉඩ දෙන්න මා සිතට
පහන් සිළ වනු කෙලෙස නුඹ කුටිය තුල දැවෙන
පහන් තරුවක් විලස දිලෙන්නට සිතෙන සඳ

රස මසවුලෙන් පිරුණු කුඩුවක සිරව සිට
බත් උලට හඬන ලොව අත් විඳින්නේ කෙලෙස
සැනසීම මිය ඇදුන සුර ලොවක හිඳිනු කිම
ආදරය පිරුණු මනු ලොව ඇත පෙනෙන විට



තරු විසුල නිල් අහස යට රැඳුන සිසිලසට
පැරදේය උණුසුමද මේ මැදුර තුල රැඳුන
තුරු ලියද ඇල දොළද විහඟ ගී රාවයද
උරුමයයි එයට වැට බැඳ දමනු රිසි මන්ද?

සමාවිය යුතුය මට මා කියන සැබෑවට
විමානය නුඹ තැනුව කුඩා වැඩි වේය මට
මුදාලනු මැනවි බැම් කමා නැත පමාවට
ප්‍රමාදය මා දැනුත් හමන්නට සොයා ලොව



# තාර පාර

කළුගල් තලාලයි පාරට දමන්නේ
ඒ ගල් තලන දසැඟිල්ලම තැලෙන්නේ
ගල් රෝලයට යටකොට මේ තනන්නේ
ජීවන මගය මං තනනා එවුන්නේ

තැලූ කළුගල්ය ආයෙත් මේ තලන්නේ
තැලෙනා එකා මය හැමදා තැලෙන්නේ
දහඩිය සමග තාරය උණු කරන්නේ
කඳුලුද සමග කලතා විසිරුවන්නේ

රළු කළු ගලට ගොන්කුර ගෙවෙනවා දුටිමි
ගොන්කුර පරදවා ජීවිත ගෙවෙනු දුටිමි
ගොන්කුර වලට හඬනා කුලවතුන් දුටිමි
පාරට තැලෙන ජීවිත නෙදුටුවා දුටිමි

සාර බාර මැතිවරු බර දරමින්නා
කාර බාර සැර පෙන්නා ඉගිලෙන්නා
තාර පාර ඒ හැම බර උහුලන්නා
පාර තැනූ එකා කාණුවෙ බැස යන්නා



# හෙට පිපෙන මල

සිසිරය මිය ඇදුන
බොල් අහස යට
වසන්තය වෙර දරයි
නොපරදින්නට ගිම්හානයට....

උණුසුමින් පිබිදුන
සියක් පත් විසිරුවන
තණ පලස මත
පුදින්න වෙර දරන
රතු සුදු කහ පැහැගත්
සිඟිති මල් කැකුළු
මැඬ පිය මනින්නට
සිත හදා ගන්නේ කෙලෙස....?

මගහරිමි තණ පළස
පය තබමි රළු පොළොවට
පිබිදෙන්න වෙර දරන
මල් යායට ඉඩ දෙමින්....

ගිම්හානයේ උණුසුම විඳ
හෙට දිනේ නුඹ පිපුන සඳ
රළු පොළොව මගෙ පයට
සුව පළසක්ම වනු ඇත


# තරණය

මේ කන්ද මා නැගුන බොහො උසයි
ගොඩ වුනේ කෙලෙස දැයි මට සිතෙයි
අත දුන්න අතලොස්ස සිහි නැගෙයි

ආ ගමන  දුෂ්කරයි හරි දුකයි
බැන්ද බැමි මග දිගට බෝ තිබෙයි
මා පයෙන් ඇද්ද වුන් අපමණයි

මට කලින් පැමිණී වුන් මෙහි සිටියි
උන් පැමිණී දැඩුමොණර මෙහි තිබෙයි
මා දෙපා නම් අනේ රිදුම් දෙයි

බිම සිටින බොහෝ අය මට පෙනෙයි
අතරමග වැටෙනවුන් ගැන දුකයි
දිගු කෙරුන මා දෑත නුඹටමයි...





# පියවරුන්ගේ දිනය දා

මහ මෙර සේ නොසැලී
දිනකර සේ බැබලී
දිවිබර ගෙන උරෙනී
පියවරුලොව තනතී

මැසිවිලි නැති මුවිනී
දුක් දොම්නස් විඳිතී
උතුරන සෙනෙහසිනී
දරු බර විඳ ගනිතී

නැගෙනා සඳ දරුවන්
නිති ඉණී මං වෙමිනා
බිම වැටෙනා විගසින්
උන් ඔසවා තබනා

දහඩිය අඩු මිළට
විකිණී යන කලද
වැඩි මිළ ජීවිතය
දරුවන් වෙත බෙදන

දිනයක් නුඹ වෙනුවෙන්
වෙන් කරලනු කෙලෙස
ජීවිතයම නුඹට
පිදිය යුතුවූ කලට

# සඟවාගත් ආදරය

රාත්‍රිය නිසසලයි
තාරුකා නිදිවරයි
මගේ සිත නුඹ ළඟයි
ආදරය සුන්දරයි

කෝල සිත ළඟ සෙනේ සඟවන්නා
පාන ඉඟි බිඟි නොදත් සේ ඉන්නා
ලෝබ ලෙස නෙත්
බැලුම් සඟවන්නා
ලාබ සිහිනෙන් නිතර හමුවෙන්නා

කළු වළාවේ විදුලි එළි සඳිසී
නෙත් සරින් නුඹ
රුව සොයා වෙහෙසී
පිරී ඉතිරෙන සෙනේ ගංගාවේ
සිසිලසය මතු නුඹට දැනුනාවේ

තාරුකාවට මූණ නොම පෙන්නා
මාස පෝයට සඳු සැඟවඋන්නා
හීන යායේ කැකුළු දුක්වෙන්නා
බෝම දුකකින් මං බලා උන්නා



# ඝාතනයෙන් කලකට පසු

සඟවන්නට එපා
නුඹ නෙතු අග දිළෙන
ඔය කඳුළු බින්දුව...
ගලා යන්නට දෙන්න ඉඩ
දෙකොපුල් තෙමාගෙන...
ලොවම දැනගත යුතුය නුඹ
මෙතෙක් කල් හැඬූ බව
හදවතින්
ලොවට රහසින්...

නවතන්න නොතනන්න
නුඹේ දුක් සුසුම් පොද
හමන්නට ඉඩ දෙන්න
කළඹවා දසන්තය..
ලොවම දැනගත යුතුය නුඹ
හදවතින් දැවෙන බව...

දියණියන් හඬන සඳ
නලවන්න නොතනන්න..
හඬන්නට ඉඩ දෙන්න
ලොවට සිහිපත් වෙන්න
ඈ පියා පෙර දිනෙක
උන් නිසා නැසුනු බව...

සැහැසියන් හා සමව
වරදකරුවන්ය උන්
ඝාතනය දැක දැකම
නොදුටු දෑසින් සිටියාට....



# සඳ එළිය සහ නුඹේ ප්‍රේමය


මළානික සඳ එළිය
එළා මල් උයනේ
සරා සඳ හිනැහේය
නිල් අහස් වියනේ

නිදැල්ලේ ගලා යන
සඳ එළිය දරාගෙන
සමන් වැල දුක් විඳින
විලාසය පෙනේ මට

ලෝබ නැති සඳවතිය
මුදු එළිය බෙදුවාට
ඒ එළිය බර වැඩියි
සුදු සමන් මල් වැලට

නෙත් සරට නුඹ හෙළන
මගේ සිත සැලුනාට
නුඹෙ සෙනේ මිළ වැඩියි
මගේ දුප්පත් හිතට

# ආත්මාර්ථයෙන් තොර ප්‍රේමය



මා විසල් නුග රුකය
වාරු දෙන නුඹටද
සම සේම ඔහුටද
නැගෙන්නට ඉහලට
මුදු ඉර එළිය ලැබුමට



# අම්මගෙ ලියුම

පොඩි එකාගේ පොතේ අග පිටුව ඉරාගෙන
කඩිමුඩියෙ ලියන්නේ මගෙ මද්දු පුතා වෙත
පඩි නැතත් එන මහේ වත් මගේ පුතේ උඹ
ගම ඒද කියාලා මග බලා ඉදිම් මම

ඉරට පැදුන වහල පෙරා දෙයි ඉර එළිය
දොරට ගත් පිට පලුව දරට වත් සුදුසු නැත
බරට බර අඩි තබා උඹ ගියපු දිනේ සිට
ඇහැට ආ කඳුළු කැට ඇහැ අතැර ගියේ නැත

වරිච්චිය දිරා ගොස් ඉරි තැළුන බිත්ති දෙක
හෙට අනිද්දා තරම කැඩී බිම වැටෙනු ඇත
දිරා ගිය කොස් ගහේ මහ අත්ත ඇද වැටී
කොයි වෙලේ පිල් කොටේ කුඩු වේද කිව නොහේ

මගේ දුක කියන්නට ගිය සුමානේ දොහක
මං ගියා අපේ මන්තිරි තුමා හමුවෙන්න
පැජරොයියෙ කළුපාට ජනේලෙන් එහා සිට
මගේ දුක දකින්නට උන්නැහේලට ඇහැක?

පන්සලේ අළුත හැදු තාප්පය පුරාවට
යුද්දයම ඉල්ලලා පෝස්ටර ගසා ඇත
තුන් යමේ මං වගේ අම්මලා අඬන විට
පෝස්ටර වසාගෙන ඒ කඳුළු ගලනු ඇත

රජෙක් වගෙ ලොකු පුතා හොරු අරන් ගිය දිනේ
මගේ රජ මාළිගේ දූවිලි ව වැනසුනේ
ඒ වගේ තවත් රජ වරු ඇතිය යාපනේ
උන් හොරෙන් අරගන්න උදවි නොම දෙනු පුතේ

යාපනේ ගැටවි තව කොටි බහට නැවෙනවද?
බීසනේ මෙහ තිවුන යාපනෙත් තියෙනවද?
දරු පැටවි පලින් පල මග දිගට මැරෙනවද?
අනේ ඒ අම්මලත් මං වගේ අඬනවද?



# ඔබ

මගේ දෑසින් දකින ලෝකය
නොදකිනා නුඹ දෑස් අබියස
සසල මා සිත
දරාගෙන දෝතින්

නිමක් නොදකින අසනි සර මැද
සෙනේහය තව බිඳක් රැකගෙන
බොහෝ ගින්දර
සිතින් විඳ ගනිමින්

මතුපිටින් නොපෙනෙනා විලසින
සියක් ගව්වක් ගැඹුරු පතුලක
තබා සෙනෙහස
නිතියෙනා රකිමින්

මාළිගාවක් තනනු රිසියෙන
කෙම් බිමක් සොය සොයා පියමැන
දෙපා රිදවන
වේදනා දරමින්

වාළුකාවේ අඳුර මගහැර
පිපුන රතු මල දකිමු අද අප
වින්ද ගින්දර
සුන්දරයි සිතමින්